මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

බුද්ධ ධර්මය I/II	8 ශ්‍රේණිය	කාලය : පැය 02 යි

ශිෂ්‍යයාගේ නම :- ....

I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුර යටින් ඉරක් අඳින්න.

1 දෙව්දත් තෙරුන් බුදුරජාණන් වහන්සේට ඉදිරිපත් කළ පංච වරයන්ට අයත් නොවන්නේ මින් කුමක්ද?
1.භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම ආරණ්‍යයකව විසිය යුතුයි.
2. භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම පිණ්ඩපාතයෙන් යැපිය යුතුයි.
3. භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම පාංශුකූලික විය යුතුයි.
4. භික්ෂූන් වහන්සේ ජීවිතාන්තය දක්වාම සේනාසනයක විසිය යුතුයි.

2. දිව්‍යාංගනාවක් ලබා ගැනීමට නම් භාවනා කළ යුතු යැයි බුදුරජාණන් වහන්සේ උපදෙස් ලබාදුන් ස්වාමීන් වහන්සේ වනුයේ
1. අනුරුද්ධ හිමිය. 2. ආනන්ද හිමිය 3. නන්ද හිමිය 4. චූල්ලපන්තක හිමිය.

3. “ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ආගන්තුකයින් පිළිගන්නා අයෙකි.සතුටු සාමීචි කතා ඇත්තෙකි. ” යනාදී වශයෙන් ප්‍රකාශ කළේ
1. භාරද්වාජ බමුණාය. 2. සෝණදණ්ඩ බමුණාය 3. චංකී බමුණාය. 4. අග්ගිභාරද්වාජ බමුණාය.

4. ධර්මරත්නයේ ගුණ අතර “ඕනෑම කෙනෙකුට මේ ධර්මය පිළිබඳව විමසා බැලීමට හැකිය” යන අදහස ඇතුලත් වන්නේ
1. ඒහිපස්සිකෝ ගුණය තුළය 2. ඕපනයිකෝ ගුණය තුළය
3. සන්දිට්ඨිකෝ ගුණය තුළය 4. අකාලිකෝ ගුණය තුළය

5. ධර්මරත්නයේ ගුණ සංඛ්‍යාව කීයද?
1. 3 කි. 2. 4 කි . 3. 6 කි. 4. 7 කි.

6. “ අනිච්චාවත සංඛාරා” යන ගාථාව ඔබට අසා ගත හැකි වන්නේ
1. දානමය පිංකමකදීය 2. අවමංගල උත්සවයකදීය
3. පිරිත් පිංකමකදීය 4. මංගල උත්සවයකදීය.

7. බුදුගුණ අතර දෙව්,මිනිස්, බඹ යන ලෝකවල සැබෑ තත්ත්වය අවබෝධ කර ගත් නිසා
1. සුගත නම් වේ. 2. සම්මා සම්බුද්ධ නම්වේ. 3. අරහං නම් වේ. 4. ලෝකවිදූ නම් වේ.

8. අගසව් දෙනමට ගිහිගෙය කළ කිරීමටහේතු වූයේ කුමන නාට්‍ය නැරඹීමෙන් පසුවද?
1. ගිරග්ග සමජ්ජ නාට්‍යය 2. මනමේ නාට්‍යය 3. කාලගෝල නාට්‍යය 4. වෙස්සන්තර නාට්‍යය

9. ඍද්ධි බලයේ අග තනතුර හිමි වූයේ කුමන රහතන් වහන්සේටද?
1. සැරියුත් හිමිට. 2. මුගලන් හිමිට 3. අනුරුද්ධ හිමිට 4. උපාලි හිමිට

10. දානය වළඳන, ශරීර කෘත්‍ය කරන, පැන් පහසු වන, සැතපෙන වේලාවල් හැර අන් සෑම වේලාවකදීම ඇමදීම සිදු කළ භික්ෂූන් වහන්සේ වනුයේ
1. කොණ්ඩඤ්ඤ භිමි 2. චුල්ල පන්ථක භිමය. 3. මහා පන්ථක භිමිය. 4. සම්මුඤ්ජනී භිමිය.

11. "පෙකනිය නොදක්වා - සළු ඇඳ බොලට දක්වා
නොපට තන සක්වා - සිනා නොමසෙන් දසන් දක්වා" මෙම කවිය ඇතුලත් වන්නේ
1. කාව්‍යශේඛරයේය. 2. ගුත්තිල කාව්‍යයයේය 3. බුදුගුණ අලංකාරයේය. 4. සිරිත්මල්දමේය.

12. බුදුරජාණන් වහන්සේ පනවා වදාළ සේඛියා ශික්ෂා පද අප අනුගමනය කළ යුතු වන්නේ
1. ගමන් බිමන් යාමේදීය 2. ආහාර පාන ගැනීමේදීය
3. යහළුවන් ඇසුරු කිරීමේදීය 4. වත් පිළිවෙත් කිරීමේදීය.

13. ගිහියාගේ නිත්‍ය සීලය ලෙස බුදු දහමේ දක්වා ඇත්තේ
1. පංච සීලයයි. 2. අෂ්ඨාංග සීලයයි. 3. දස සීලයයි. 4. සාමනේර සීලයයි.

14. සිඟාලෝවාද සූතයේ සඳහන් වන ආකාරයට <u>" අවමන් නොකිරීම"</u> කා විසින් කා හට ඉටු කළ යුතු යුතුකමක්ද?
1. භාර්යාවගෙන් - ස්වාමි පුරුෂයාට 2. ස්වාමිපුරුෂයාගෙන් - භාර්යාවට
3. සේවකයාගෙන් - ස්වාමියාට 4. ගුරුවරයාගෙන් - ශිෂ්‍යයාට

15. බුදුන් වහන්සේ " මහණෙනි, මාගේ ප්‍රඥා මහිමය ප්‍රකට වූයේ අද පමණක් නොවේ.සසර පෙර ආත්ම භවවලදීත් එසේම සිදු වූ බව " සඳහන් කරමින් දේශනා කළේ
1. උම්මග්ග ජාතකයයි. 2. තේමීය ජාතකයයි. 3. වට්ටක ජාතකයයි. 4. සුතසෝම ජාතකයයි.

16. ජෛන ආගමික නායකයෙකු වූ නිගන්ඨනාථ පුත්ත නම් ශාස්තෘවරයාගේ ප්‍රධාන දායකයා කවුද?
1. සිගාල ගෘහපතියා 2. උපාලි ගෘහපතියා 3. පිප්ඵලී මානවකයා 4. මඝ මානවකයා

17. සාමාන්‍ය දුක, වෙනස්වීම පිළිබඳ දුක, සංස්කාර පිළිබඳ දුක යන දුක චතුරාර්ය සත්‍ය යේ කුමන සත්‍යයට අයත් වේද?
1. දුක්ඛ සත්‍යයට 2. සමුදය සත්‍යයට 3. නිරෝධ සත්‍යයට 4. මාර්ග සත්‍යයට

18. පංචස්කන්ධයට අයත් වන්නේ
1. රූප,වේදනා,සඤ්ඤා,සංඛාර,විඤ්ඤාණ 2. රූප,වේදනා,සඤ්ඤා,සංඛාර,උපාදාන
3. රූප,වේදනා,සඤ්ඤා,සංඛාර,අවිද්‍යා 4. රූප,වේදනා,සඤ්ඤා,සංඛාර,නාමරූප

19. තණ්හාවේ ආකාර තුනක් පිළිබඳව සඳහන් වන්නේ චතුරාර්ය සත්‍ය යේ කුමන සත්‍යයටද?
1. දුක්ඛ සත්‍යයට 2. සමුදය සත්‍යයට 3. නිරෝධ සත්‍යයට 4. මාර්ග සත්‍යයට

20. " මහණෙනි මම චේතනාව කර්මය යයි කියමි". මේ අනුව කර්ම සිදුවන දොරටු තුන වනුයේ
1. සිත,කය හා වචනයයි. 2. ලෝභ,ද්වේෂ හා මෝහයයි
3. රූප,වේදනා,සඤ්ඤායි 4. කාම,භව විභවයයි

II කොටස

★ **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න**

★ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

★ **පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. අනෙක් ප්‍රශ්නවලට ලකුණු 10 බැගිනි.**

01 (i) එකමුතුව දිවි ගෙවමු යන පාඩමේ සඳහන් වන ආකාරයටබුදුරජාණන් වහන්සේ සමඟ වාදයට පැමිණියේ කවුරුන්ද? (ල.02)

(ii) අන්‍ය ආගමිකයින් සමඟ සුහදව කටයුතු කළ වලදීපළමුව සිදු කළ ගුණයන් 03ක් ලියන්න. (ල.03)

(iii) තමා උපමා කර අන් අයට හංසා නොකළ යුතු බව සඳහන් සූත්‍රය කුමක්ද? (ල.02)

(iv) ශිෂ්ට සම්පන්න ජාතියක් වශයෙන් හැඩ ගැසීමට ශ්‍රී ලාංකිකයින්ට මඟ පෙන්වූ අනගිතම දායාදය කුමක්ද? (ල.02)

(v) ආක්‍රමණිකයෙකු වුවද අවසානයේ නිසි ගෞරවය දැක්විය යුතු යයි සඳහන් කළ රජතුමා කවුද?(ල.02)

(vi) පටිමාසර නිර්මාණය කිරීමේදී අනුගමනය කර ඇති ගෘහ නිර්මාණ සම්පුදාය කුමක්ද? (ල.03)

(vii) බුදුරජාණන් වහන්සේගේ සිරිපා සලකුණ හෙවත් ශ්‍රී පාදස්ථානය පිහිටා ඇත්තේ කොහේද? (ල.02)

(viii) ශ්‍රී ලංකා ජන සමාජය සාමයෙන්, සමගියෙන් ජීවත් වූ බවට නිදසුන් 02ක් ඉදිරිපත් කරන්න. (ල04)

02. (i) බුදුරජාණන් වහන්සේගේ චරිතයේ පිළිබිඹු වන ආචාරශීලී ගුණාංග 02ක් නම් කරන්න. (ල.02යි)

(ii) "ගුරු බස සැබෑමය"..... යන කවියේ ඉතිරි පද තුන සම්පූර්ණ කරන්න. (ල.03යි)

(iii) බුදුරජාණන් වහන්සේ තුළ පැවති ආචාරශීලී ගුණාංග ඔබේ ජීවිතය සාර්ථක කර ගැනීමට

03. (i) ධර්ම රත්නයේ ගුණ කීයද? (ල.02යි)

(ii) ඉන් තුනක් නම් කරන්න. (ල.03යි)

(iii) ඔබ නම් කළ ගුණ දෙකක සිංහල අදහස ලියා දක්වන්න (ල.5යි)

04. (i) සිරිත් විරිත් යනු මොනවාද? (ල.02යි)

(ii) බෞද්ධ සිරිත් විරිත් 03ක් ඇතුළත් වගුවක් සකස් කරන්න (ල.03යි)

(iii) ඔබගේ උපන් දිනය වෙනුවෙන් බෝධි පූජාවක් සංවිධානය කරගන්නා ආකාරය කෙටියෙන් දක්වන්න. (ල.5යි)

05.(i) අගසව් දෙනමගේ ගිහිකල හැඳින්වූ නම් දෙක ලියන්න. (ල.02යි)

(ii) මුගලන් මහරහතන් වහන්සේගෙන් ශාසනයට සිදුවූ සේවාවන් 03ක් නම් කරන්න (ල.03යි)

(iii) අගසව් දෙනමගේ චරිතවලින් අපේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ 05ක් ලියන්න. (ල.05යි)

06. (i) සීලය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න (ල.02යි)

(ii) පන්සිල් පිළිවෙළින් ලියන්න (ල.03යි)

(iii) සිල් සමාදන්වීමේ වැදගත්කම පිළිබඳ වාක්‍ය 05ක් ලියන්න. (ල.05යි)

07. (i) බුද්ධ දේශනාවේ සඳහන් අටවැදෑරුම් දුක් අතරින් 02ක් නම් කරන්න (ල.02යි)

(ii) දුක්ඛ සත්‍ය යේ ආකාර 03 ලියන්න (ල.03යි)

(iii) කාම තණ්හා පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න (ල.05යි)